

# විප්ලවවාදියකුගේ සැබෑ කතාව

ජගත් ජේ එදිරිසිංහ ලියයි

විප්ලවවාදියා වාඩි වී සිටියේ මට පිටුපා ගෙන ය. ඔහුට ඉදිරියෙන් වූ මහා සාගරය දෙස ඔහු නිහඬව නෙත් යොමා සිටියේ ය. මම ඒ දැහැනට බාධා නොකර බලා සිටියෙමි. නවතා ඇති නැව් කීපයක් සිතිජයට මෙපිටින් පෙනෙයි. මෙල්බන් වරායට ඇතුල්වන්නට තම වාරය පැමිණෙන තෙක් බලා සිටිනා නැව් විය යුතුය. සුළඟේ මහ ගොස ත් මුහුදු රළ පෙරළෙන හඬත් පරිසරය වසාගෙන සිටියි. මුහුදේ එක් ඈත කෙළවරක ගොඩබිමක සෙ-'යාවක් අලු පැහැයෙන් පෙනෙයි. ඒ මෙල්බනයට බටහිරින් පිහිටි ජීලොං ප්‍රදේශය බව මම දනිමි. ඒ අලු පැහැ සේයාවනට මෙපිටින් මෙල්බන් නගරයේ උස් ගොඩනැගිලි තුඟුව නැගී සිටියි.

මම වාඩි වී සිටි තැනින් නැගිට ගොස් ඔහු අසළින් වාඩි වෙමි. ඔහු මා දෙස හැරී බලයි.

"එදත් මුහුද මේ වගේම මහා සද්දයක් කළා.." ඔහු කියයි.

"කවදද..?" මට අසන්නට ඇවැසි පැනය නොඅසා මම අසා සිටින්නෙමි.

"මගේ ඇස් බැඳල තිබුණෙ.. අත් දෙකම පිටිපස්සට කරලා කිටි කිටියෙ බැඳලා තිබුණා.. රැයක් දවාලක් ගැන නිනව්වක් තිබුණෙ නැහැ.. ඒ වෙලාවෙත් මේ වගේම මුහුදෙ සද්දෙ විතරයි ඇහුණෙ.. ඒ වෙලාව මහ රෑ කියලා මට දැනුණා.."

"තව කවුද හිටියෙ..?"

"හමුදාකාරයො හත් අට දෙනෙක් ඉන්න ඇති කියලා දැනුණා.. කොල්ලො හිටියෙ මං විතරයි.. හිටිය නම් මට දැනෙනවා.. මට එහෙම දැනුණෙ නැහැ.. අනික කෑම්ප් එකෙන් ගත්තෙ මාව විතරයි.. අද තොගේ අන්තිම දවස.. කියලයි මාව ඇදලා වාහනේට දාගත්තෙ .. මගදි වෙන කාවවත් නග්ග ගත්තෙත් නැහැ.. හුඟක් වෙලා එහෙ මෙහ රවුම් ගහලයි බීච් එකට ආවෙ.. කොයි ලෝකෙ ගියාද කියල මං දන්නෙ නැහැ.. මං හිටියෙ මනුස්සයෙකුට කියලා තේරුම් කරලා දෙන්න බැරි මානසික තත්වයක" ඔහු කියයි.

"ඊළඟට මොකද වුණේ..?"

"උං මාව තල්ලු කරගෙන වෙරළට ආවා.. අපි අද තෝව ඉවර කරනවා.. උං කිව්වා.. මාත් දැනගෙන හිටියා ඒ මගේ අන්තිම වෙලාව කියලා.. ඇති වෙන්න පහර කාලා මං හොඳටම හෙම්බත් වෙලා හිටියෙ.. නිගිටලා හිටියෙත් අමාරුවෙන්"

මම ඔහුගේ මුහුණ බලමි. එහි ඇත්තේ වේදනාවක්දැයි මට නොතේරෙයි. ඔහු සිය හැඟීම් සඟවා ගනිමින් සිටින්නේ යයි මට සිතෙයි.

"පිස්තෝලයක අගුල අරින සද්දෙ මට ඇහුණා.. ඊළඟට මගේ කනට පිටිපස්සෙන් පිස්තෝලෙ සීතල බටේ තියනවා මට දැනුණා.."

"මොනාද හිතුණෙ ඒ වෙලාවෙ.."

"නොහිතුණේ මොනාද කියල ඇහුව නම් ලේසියි උත්තර දෙන්න.. සාධාරණ සමාජයක් ගොඩ නගන්න ජීවිතයම කැප කරපු මට අන්තිමේ අපේ පන්තියෙම එකෙක් අතින් වෙඩි කන්න වෙනවා නේද කියන එක තමයි ලොකුම වේදනාවක් ගෙනාවෙ.. අම්ම තාත්තා.. වයිෆ්... හැමෝම මතක් වුණා.. ව්‍යාපාරෙ අනිත් සහෝදරවරු හැමෝම මැ-රෙන්න ඇත්තෙ මේ වගේම නේද කියලත් හිතුණා.. ඇත්තම කිව්වොත් බයක් කියන හැඟීමක් මට දැනුණෙ නැහැ.. නිකම් හිස් බවක් වගේ දෙයක් තමයි දැනුණෙ.." ඔහු සිය කතාව නවතා කල්පනාවකට වැටෙයි.

"අපි අපේ ජීවිත කැපකළේ යහපත් සමා-ජයක් පිළිබඳ බලාපොරොත්තුවෙන්.. අපි වෙනුවෙන් නෙවෙයි.. සමස්ථ ජනතාව වෙනුවෙන්.. අපෙන් පස්සෙ එන පරම්පරාව වෙනුවෙන්.. හුඟ දෙනෙකුට අපිව තේරුම් ගන්න බැරිවුණා.. අනේ මේ මිනිස්සු මේ ජීවිත පූජා කරන්නෙ අනුන් වෙනුවෙන් නේද කියන එක කාටවත් තෙරුණේ නැහැ.. අපි කිව්ව දේට වඩා අපට එරෙහිව ගොඩ නගල තිබ්බ අවලාද බලවත් වුණා.. අපට තුවක්කුව එල්ල කළේ අපි සේවය කළ පන්තියේම එවුන්.."

කියන්නට බොහෝ දේ ඔහුට ඇති බව මම දනිමි. එනමුදු වළක්ව ගත නොහැකි කුතුහලයකින් මගේ සිත පිරෙයි. මගේ නොයිවසිලිමත් බව ඔහුට වැටහෙන්නට ඇත .

"පිස්තෝල සීතල මට දැනුණෙ ගින්දරක් වගේ.. ඊළඟ තත්පරේදි පිස්තෝලෙ බටේ ටිකක් හෙළවුණා.. මට ඇහුණේ හෙණයක් ගහනවා වගේ ඩෝං ගාන සද්දෙ විතරයි.." ඔහු කතාව නවත්වයි. හෙළු සුසුමක් මුහුදු සුළඟ හා එක්වෙයි.

ඔහු මා දෙස බලයි.

"මගේ හිත ඇතුලෙ ගොඩක් දේ තියෙනවා.. ඒක හරි බරක්.. කවදා හරි කාට හරි කියන්න ඕනෙ.."

"කියන්න.. මං අහගෙන ඉන්නම්" මම ඔහු උනන්දු කරමි.

"මං මගේ කතාව කියන්නං.. ඔයා ලියන්න.."

මම ඔහුගේ අත මත මගේ අත තබමි.

"අපි ලියමු.." මම කියන්නෙමි.

ඔහු කියන ඒ කතාව මම ළබන කළාපයේ සිට සන්නසට ලියන්නෙමි. ජනක රත්නායක ඒ කතාව සිතුවමට නගනු ඇත.

ඒ විප්ලවවාදියකුගේ සැබෑ කතාවයි. කිසිම තැනක නොලියවුණ සැබෑ කතාවයි.